අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk

මගේ යොමුව / எனது இல. / My Ref. ED/09/12/02/07/03    ඔබේ යොමුව / உமது இல. / Your Ref.    දිනය / திகதி / Date 2023.02.01.

මුදිත පීරිස් මහතා,
සභාපති හා ප්‍රධාන විධායක නිලධාරී,
ලිට්‍රෝ ගෑස් ලංකා සමාගම,
යුනියන් පෙදෙස,
කොළඹ 02.

**පරිසර ආරක්ෂාව සම්බන්ධයෙන් දිප ව්‍යාප්ත පාසල් ප්‍රශ්න විචාරාත්මක තරඟාවලියක් පැවැත්වීම**

උක්ත කරුණ සම්බන්ධයෙන් ඔබ විසින් අධ්‍යාපන අමාත්‍යාංශය වෙත යොමු කරන ලද 2023.01.05 දිනැති ලිපිය හා බැදේ.

එමගින්, උසස් පෙළ හදාරන පාසල් සිසු සිසුවියන් අතර දැනුම මිනුම සහ කථික තරඟාවලියක් පැවැත්වීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් කර ඇත.

ඒ අනුව, පහත සඳහන් කොන්දේසි වලට යටත්ව අනුමැතිය ලබා දෙන බව කාරුණිකව දන්වමි.

1. Covid 19 උවදුරෙන් ආරක්ෂා වීම සඳහා, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් ලබා දී ඇති උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු ය.
2. අදාළ පාසල්වල විදුහල්පති එකඟතාව ලබාගත යුතු ය.
3. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට බාධා නොවිය යුතු ය.
4. ගුරුභවතුන්ගේ පූර්ණ අධීක්ෂණය යටතේ වැඩසටහනට සිසුන් සම්බන්ධ කරගත යුතුය.
5. දෙමාපිය ලිඛිත අවසරය ලබාගත යුතු ය.
6. උක්ත වැඩසටහන සඳහා සිසුන්ගෙන් හෝ දෙමාපියන්ගෙන් කිසිදු මුදලක් එකතු නොකළ යුතු ය.
7. පළාත් පාසල් සම්බන්ධ කර ගන්නේ නම් අදාළ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂගේ අවසරය ලබා ගත යුතු ය.
8. මෙම වැඩසටහන සඳහා සහභාගී වන සිසුන්ගේ ආරක්ෂාව, සනීපාරක්ෂක පහසුකම් හා විනය සම්බන්ධ සියලුම වගකීම ඔබ ආයතනය විසින් දැරිය යුතු ය.
9. වැඩසටහන සඳහා සහභාගී වන නිලධාරීන්, දේශකයින් සහ සම්පත්දායකයින් පිළිබඳ සියළු විස්තර / සුදුසුකම් පිළිබඳ තොරතුරු ලබා ගත යුතු ය. විනය විරෝධී විෂමාචාර ක්‍රියාවන්ට සම්බන්ධ නොමැති පුද්ගලයින් පමණක් සහභාගී කරවා ගත යුතු ය.
10. පාසල් සංවර්ධන අරමුදල වෙනුවෙන් සිදු කරනු ලබන මූල්‍ය පිරිනැමීම පාසල් සංවර්ධන ගිණුම හරහා හුවමාරු විය යුතු ය.

අත්.කළේ/ ඊ.ඩබ්ලිව්.එල්.කේ.එගොඩවෙල
අතිරේක ලේකම් (පාසල් කටයුතු)
අධ්‍යාපන ලේකම් වෙනුවට

පී.ඩබ්.අමරදිවාකර
අධ්‍යාපන අධ්‍යක්ෂ
(පාසල් කටයුතු)

පිටපත්:
1. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ,.................... පළාත් අධ්‍යා.දෙපාර්. } කරු.දැ.ගැ.ස.
2. අධ්‍යාපන අධ්‍යක්ෂ (ජාතික පාසල්)



Scanned with CamScanner

LITRO GAS

## ලිට්රෝ ගෑස් "හෙට සුරකින අපේ ළමයි" දැනුම මිනුම සහ කථික තරගාවලිය

01- ලිට්රෝ ගෑස් ලංකා සමාගම උසස් පෙළ විද්‍යා අංශයේ සිසුන් සදහා මෙම වැඩ සටහන සිංහල භාෂා මාධ්‍යයෙන් පවත්වනු ලබයි.

02- මෙම තරගය සදහා පාසලකින් සිසුන් 5 දෙනෙකු සදහා සහභාගී විය හැක.

03- ඉදිරිපත් වන සිසුන්ගෙන් 4 දෙනෙකු කණ්ඩායමක් ලෙස ප්‍රශ්ණ විචාරාත්මක වැඩ සටහනට යොමු කෙරෙනා අතර අනෙක් සිසුවා කලින් ලබා දෙන මාතෘකාවක් යටතේ තම කථිකත්වය ඉදිරිපත් කල යුතුය.

04- තරගාවලිය සදහා පරිසර ආරක්ෂාව,ගෘහස්ත වායු දූෂණය,ආහාර පිසීමේ ඵලදායිතාවය හා එල් පී ගෑස් භාවියේදී මුලුතැන්ගෙයි ආරක්ෂාව යනු කරුණු ආවරණය වන පරිදි ප්‍රශ්ණ මෙන්ම මාතෘකා ඉදිරිපත් කරනු ඇත.

05- තරගය සදහා තෝරා ගන්නා පාසල් සහ තරග පැවැත්වෙන දිනයන් සහ ස්ථානයන් විද්‍යුත් තැපැල මගින් අදාල පාසල් සදහා යොමු කරනු ඇත.

06- අධ්‍යාපන කොට්ඨාශ මට්ටමේ සිට ජාතික මට්ටම දක්වා තරග වට 3කින් මෙම වැඩ සටහන් ක්‍රියාත්මක වේ.

07- තරගය සදහා තෝරාගනු ලබන සියලු පාසල්වල සංවර්ධන අරමුදල වෙනුවෙන් මූල්‍ය පිරිනැමීමක් සිදු කරනු ලැබේ.

08- මුල් වටයට හා අවසාන වටයට සහභාගී වන සිසුන් සදහා වටිනා ත්‍යාග, සහතිකපත් සහ අවසාන තරගය සදහා කුසලාන ප්‍රධානය කරනු ලැබේ.

09- සියලුම අයදුම් පත් 2023 මාර්තු මස 10 වන දිනට පෙර පහත සදහන් විද්‍යුත් ලිපිනයට (csc@litrogas.com) හෝ තැපැල් ලිපිනයට (ලිට්රෝ ගෑස් ලංකා සමාගම, අලෙවි අංශය, නො 267, යූනියන් පෙදෙස, කොළඹ 02) යොමු කළ යුතුය.ලියුම්කවරයේ වම්පස කෙළවර **දැනුම මිනුම** තරගය ලෙස සදහන් කල යුතුය

10- මෙම තරගයේදී පලමුව යොමු කරනු ලබන අයදුම්පත් සදහා ප්‍රමුඛත්වය ලබා දෙනු ලැබේ.

11- තරගයට අදාල සියලුම සවිස්තරාත්මක කොන්දේසියන් තෝරාගනු ලබන පාසල් සදහා විද්‍යුත් තැපැලෙන් තරගයට පෙර යොමු කරනු ලැබේ.

12- අවශ්‍ය වැඩිදුර තොරතුරු 0773 991 079 (මිලංග චන්ද්‍රසිරි) දුරකතන අංකය හරහා ලබා ගත හැක

**ලිට්රෝ ගෑස් ලංකා සමාගම**

CS Scanned with CamScanner

LITRO GAS

# ලිට්රෝ ගෑස් දිවයින පුරා "හෙට සුරකින අපේ ළමයි" දැනුම මිනුම සහ කථික තරගාවලියේ අයදුම් පත්‍රය

පළාත ..................................................

කලාපය ..................................................

කොට්ඨාශය ..................................................

පාසලේ නම ..................................................................................................

ලිපිනය ..................................................................................................

දුරකතන අංක 01- .............................................. 02-..............................................
(අවම වශයෙන් දුරකතන අංක 2ක් අවශ්‍ය වේ)

විද්‍යුත් තැපැල ..................................................................................................

චෙක්පත් බැරකල හැකි ගිණුමේ නම ..................................................................

..................................................................................................
(පාසලේ හෝ පාසල් සංවර්ධන සමිතියේ විය යුතුය)

**තරගය සඳහා සහභාගි වන ශිෂ්‍ය තොරතුරු**

| තරග විස්තරය | | සම්පූර්ණ නම | ශ්‍රේණිය |
|---|---|---|---|
| ප්‍රශ්ණ විචාරාත්මක කණ්ඩායම | 1 | | |
| | 2 | | |
| | 3 | | |
| | 4 | | |
| කථික සාමාජික | 5 | | |

ලිට්රෝ ගෑස් සමාගම සහ අධ්‍යාපන අමාත්‍යාංශය ඒකාබද්ධව පවත්වනු ලබන මෙම වැඩ සටහන සඳහා ඉහත සඳහන් සිසුන් සහභාගිකරවා ගැනීමට අනුමැතිය ලබා දෙමි.

විදුහල්පතිවරයාගේ නම ..................................................................................................

..................................................
අත්සන හා නිල මුද්‍රාව

වැඩිදුර තොරතුරු සඳහා (0773991079) මිලංග චන්ද්‍රසිරි
ලිට්රෝ ගෑස් ලංකා සමාගම

CS Scanned with CamScanner